# පල්ලේපොල ප්‍රාදේශීය සභාව

## මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද , ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනියන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1:3:1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සකස් කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුවේ තැන්පත් නොකළ රු.1,101,435 ක වටිනා චෙක්පත් 04 ක් හා රු.9,390 ක මුදල් ශේෂයක් අතැති මුදල් ලෙස දක්වා තිබුණත් එය ශේෂ පත්‍ර සටහන් වල නිලධාරීන් වෙත ඇති මුදල් ලෙස අනාවරණය කර නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් කට්ටි 06 ක වටිනාකම වූ රු.428,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලේ දායකය ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.672,569 ක මුදලක් බැරකම් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 32,377 ක් වූ සේවක ඇප ශේෂ යාවත්කාලීන කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,564,565 ක නොපියවූ වියදම් සඳහා කර්මාන්ත හා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) මහා මාර්ග දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ඉටුකිරීමට අපේක්ෂිතව පැවති මාදිපොල පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.852,777 ක මුදලක් කර්මාන්ත ණයගැතියන් යටතේ 2009 වර්ෂයේ සිට පෙන්නුම් කරනු ලැබුවද ප්‍රතිපාදන නොලැබීම මත එකී කර්මාන්තය ඉටුකර නොතිබූ අතර මෙය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1:3:2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.37,972,663 ක් වූ අතර, උපයෝගි ලේඛන අනුව ශේෂයන්ගේ එකතුවරු.37,201,221 ක් විය.

1:3:3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 2,113,794 ක් විය.

1:3:4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 04 කට පිළිතුරු සපයා නොතිබු අතර,එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.1,439,957 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,251,132 ක් වූ

ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1:3:5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නිති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | |
| (i) 132(ඒ) වගන්තිය | ප්‍රජා පිළිගැනීම් සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුත් යම් සිද්ධි හෝ අවස්ථා පිළිබඳ උත්සව පැවැත්වීම සම්බන්ධයෙන් එක් වර්ෂයක මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන වියදමක් සහ අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ණ අනුඥාව ඇතිව ඒ ඒ කාර්යයන් සඳහා දැරිය හැකි වුවත්, එබදු අනුමැතියකින් තොරව අවස්ථා 06 කදී රු.40,656 ක වියදම් දරා තිබුණි. |
| (i) 170 වගන්තය | සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ශීර්ෂයන් අතර රු.335,378 ක ප්‍රතිපාදන මාරුකිරීම් කරගෙන තිබුණි. |
| (ආ) <u>1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති මාලාව</u> | |
| (i) 99 රීතිය | සියලුම ගෙවීම් වවුචර් සහතික කිරීම සභාපතිවරයා විසින් හෝ එසේ සහතික කිරීමට බලය දෙන ලද්දේ නම් උපසභාපතිවරයා විසින් හෝ කළ හැකි වුවත්,සමාලෝචිත වර්ෂයට අදාළ |

| | |
|---|---|
| | රු.11,233 ක් වටිනා ගෙවීම් වවුචර් 05 ක් එසේ සහතික කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ii) 115 රීතිය හා මු.රෙ 237(ආ) | මිලදී ගන්නා ගබඩා ද්‍රව්‍ය ලැබුණු බවට හා තොග පොතෙහි ඇතුළත් කරන ලද බවට සහතිකයක් මගින් තහවුරු කළ යුතු වුවත් ගබඩාව භාණ්ඩ ලැබීමට පෙර 2010 දෙසැම්බර් 31 දිනැති අංක 1267 දරන වවුචරයෙන් රු.77,130 ක් වූ ගෙවීම් කර තිබුණි |
| (iii) 208 රීතිය | ගබඩා හා ද්‍රව්‍ය සැපයීම හැකිතාක්දුරට පොදු තරඟ කාර්ත්වයක් අනුව සිදු කළ යුතු අතර, අදාළ සේවාවේ වටිනාකම රු.50,000 ඉක්මවනු ලැබේ නම්, දිනපතා පුවත්පත්වල අදාළ දැන්වීම පළකල යුතු වුවත්,රු.74,600 ක ටයර් මිලදී ගැනීම සම්බන්ධයෙන් එසේ කටයුතු නොකර අදාළ මිලදී ගැනීම් සිදුකර තිබුණි. |

(ඇ) <u>1978 අංක 41 නගාරික සංවර්ධන අධිකාරි පනත</u>

| | |
|---|---|
| 21 වගන්තිය | අනුමත නිවාස ඉදිකිරීම් වෙනුවෙන් අනුකූලතා සහතික ලබාදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 53 න් 05 ක් සඳහා ද, ඉකුත් වර්ෂයේදී අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 46 න් 02 ක් සඳහා ද එකී සහතික නිකුත් කර තිබූ අතර,ඉතිරි ඉල්ලුම්පත් සම්බන්ධයෙන් පසු පරීක්ෂාවක් හෝ කර නොතිබුණි. |

(ඈ) <u>2006 අංක 10 දරන දේශීය ආදායම් පනත</u>

| | |
|---|---|
| 153 වගන්තිය | රු.50,000 ට වැඩි මිලදී ගැනීම් වලින් 5% ක රඳවා ගැනීමේ බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු |

වුවත් රු.77,130 ක විදුලි උපකරණ මිළදී ගැනීම් වෙනුවෙන් රු.3,856 ක බදු අඩුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
-----------------------------------------------
මු.රෙ 1646

ප්‍රාදේශීය සභාව සතු ත්‍රිරෝද රථයේ , ට්‍රැක්ටරයේ සහ අත්ට්‍රැක්ටරයක පිළිවෙළින් මාස 09 ක 04 ක සහ 12 ක ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) <u>පළාත් ආදායම් කොමසාරිස්ගේ අංක 01/2001 හා 2001 ජූලි 17 දිනැති චක්‍රලේඛය</u>
3:1 ඡේදය

ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම් සඳහා මුලු විකුණුම් වටිනාකමින් 1% ක පිරිවැටුම් බද්දක් අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, රු.75,208 ක ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම් වෙනුවෙන් රු.752 ක පිරිවැටුම් බදු අයකර ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක මප/පපා/කො/ච/අංක2006/3/1 හා 2006 ජුනි 09 දිනැති චක්‍රලේඛය

කාර්මික නිලධාරින් සඳහා වරු 06 ක සංයුක්ත දීමනාව හා සැතපුම් 200 ක උපර්මයකට යටත්ව යතුරු පැදි සඳහා සැතපුම් කුලි ගෙවිය හැකි වුවද එයට අමතරව රු.1,313 ක දීමනා විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,574,428 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,162,499 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන් තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i)වරිපනම් හා බදු | 301 | 319 | 267 | 270 | 231 | 39 |
| (ii) බදු කුලී | 407 | 387 | 10 | 505 | 427 | 78 |
| (iii) බලපත්‍ර ගාස්තු | 511 | 559 | 10 | 551 | 440 | 111 |
| (iv) වෙනත් ආදායම් | 15,555 | 16,203 | 4,604 | 2,176 | 2,486 | - |

### 2:2:2 වරිපනම් බදු

(i). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) වගන්තියේ විධිවිධාන අනුව, හිඟ වරිපනම් බදු රු.267,051 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). අවසන්වරට වරිපනම් ප්‍රතිශෝධනය කළ 2004 ජනවාරි 01 දිනෙන් පසුව වර්ෂ 07 ක් ගතවී තිබියදීත් වරිපනම් ප්‍රතිශෝධනයක් කිරීම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාද කර නොතිබුණි.

### 2:2:3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.229,415 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු3,476,737 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. එයින් 2002 වර්ෂයට පෙර සිට පැවත එන රු.819,357 ක ගාස්තු පැවතුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු | රු. | රු. | රු |
| පුනරාවර්තන වියදම් | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පෞද්ගලික පඩිනඩි | 10,243 | 10,292 | (49) | 10,788 | 9,878 | 910 |
| අනෙකුත් | 4,970 | 4,602 | 368 | 5,452 | 3,972 | 1,480 |
| උපඑකතුව | 15,213 | 14,894 | 319 | 16,240 | 13,850 | 2,390 |
| ප්‍රාග්ධන වියදම | 11,550 | 40,617 | (29,067) | 11,000 | 7,186 | 3,814 |
| මුළු එකතුව | 26,763 | 55,511 | (28,748) | 27,240 | 21,036 | 6,204 |

2.4 මානව සම්පත් කළමනාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතිය | 16 | 15 |
| ප්‍රාථමික | 14 | 13 |
| වෙනත්(අනියම් ,තාවකාලික) | - | 09 |

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

(අ) නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු.814,150 ක් වූ වාහන හා කාර්යාල උපකරණ පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

(ආ) 2007 වර්ෂයේ සන්නිවේදන පියස ව්‍යාපෘතය සඳහා රු.73,000 ක් වටිනා දුරකථන බිල්පත් යන්ත්‍ර (DIGICOM) 02 ක් හා රු.20,000 ක් වටිනා මුදල් සටහන් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, 2009 සැප්තැම්බර් 25 දින සිට මෙම ව්‍යාපෘතියේ කටයුතු නවතා දමා තිබු බැවින්, එකී යන්ත්‍ර කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩා කර තිබුණි.

2:5:2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.18,572,249 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,041,551 ක් විය.

2:5:3 අයවිමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.1,574,866 ක් වූ අතර,අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවිම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.200 ක් විය.

2.5.4 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.140,129 ක් විය.

2.6 අවිධිමත් ගණුදෙනු

1999 සිට 2002 දක්වා අයකර තිබූ භාණ්ඩ හා සේවා බදු රු.9,274 ක් හා 2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අයකර තිබූ මුද්දර ගාස්ත රු.6,350 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

2:7 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෝමාපොල සුසානභූමිය වටා වැටක් ඉදිකිරීම සඳහා අවස්ථා 02 කදී රු.26,475 ක් වැයකර කොන්ක්‍රීට් කනු 59 ක් මිලදී ගෙන තිබුණද ,2011 මැයි 25 දින වන විටත්, අදාළ කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා කසල වලවල් 02 ක් කැපීම සඳහා දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තා මිළ ගණන් සැලකිල්ලට නොගෙන පෞද්ගලික ආයතනයකට පැය ගණන පමණක් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා රු.16,390 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

2:8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 1999 වර්ෂයේදී මැතිවරණ පුහුණු පන්තියකට සහභාගීවීම වෙනුවෙන් හිටපු ලේකම්වරයෙකුට ගෙවා තිබූ ගමන් වියදම් රු.600 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විස්තර සොයාගත නොහැකි වසර 10 කටත් පෙර සිට ඉදිරියට එන රු.40,150 ක හිඟහිටි බලපත්‍ර ගාස්තු හා රු.37,500 ක විවිධ ණයගැති ශේෂයක් පැවතුණද, එකී ශේෂ අයකර ගැනීමට හෝ විධිමත් පරිදි පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) . ආදායම් පරිපාලනය

(ආ). තොග ගබඩා පාලනය

(ඇ). ණයගැති හා ණයහිමි පාලනය

(ඈ). වත්කම් කළමනාකරණය